පළාත් පාලන ආයතනවල වගවීම ඉහළ නංවන EU ව්‍යාපෘතිය

මහවැවේ සොරොව්ව ඇරිය වගේ සතාවෙන් ගලාගෙන ආ ප්‍රශ්න ටිකින් කැලඹැල්ල පිරිල.

ටිලඟට උදාවුණේ ඡන්දය විමසන අවස්ථාව.

ඡන්දය දෙන්න තිබුණේ පුද්ගලයන්ට නෙවෙයි; ප්‍රශ්නවලට. ඡන්දය ප්‍රකාශ කරන්න ඡන්ද පත්‍රිකා වෙනුවට ලැබුණේ ජේලිවෝලු

මින්නේරියේ 1 1/4 කණ්ඩායේ මිණිහිර ග්‍රාම සංවර්ධන සමිති ශාඛාවට එක්රස්වෙලා හිටපු ගම්වාසීන් සාමකාමීව ඡන්දය දෙන ස්ථානයට ගිහින් තමන්ට වඩාත්ම දැනෙන ප්‍රශ්නය සහිත මංපුසාවට පිළිබෝලය බහාලමින් ඡන්දය ප්‍රකාශ කළා.

''ඔතන ලියැවිලා නැති තවත් ප්‍රශ්න තියෙනවා. අපේ සංවර්ධන වැඩවලට වෙන්වෙන සොව්වම් මුදලිනුත් වැඩේට යෙදෙවෙන්නේ හාගයෙන්.කොන්ත්‍රාත් එකට සම්බේධ සමිතිය අත්සන් කළාට ඒක කරන්නේ මංත්‍රිතුමා, නැත්නම් එතුමාගේ ගෝලයෙක්. මතක්තයලාට ඒවා ගැනත් මොනවහරි කරන්න පුළුවන්ද ?''

''පසුගිය කාලේ ලක්ෂ 100 ක් වියදම් කළා කියල අපි වෙනුවෙන් ජල ව්‍යාපෘතියක් හදලා. කෝරියක් වියදම් කළාට පස්සෙත් අපිට වතුර නැහැ. ඒකේ වැරදිදද කොහෙද්ද කියල සොයල බලන්නත් පුළුවන්ද ?''

ප්‍රශ්න ඉදිරිපත් කරල ඉවරවෙලා ඡන්දෙ ගණන් කරන වෙලාවේත් තව තවත් ප්‍රශ්න ....

මින්නේරිය 1 1/4 කණ්ඩායේ ප්‍රදේශවාසීන්ගේ ඡන්දයෙන් වැඩිම මහාපය ලැබුණේ ඉඩම් ඔප්පු සිම්කම් සම්බන්ධ ගැටලුවට. එය මින්නේරියට සුවිශේෂී ගැටලුවක්. ටිලඟට වැඩිම මහාපය ලැබී තිබුණේ පානීය ජල පහසුකම් ප්‍රශ්නයට.

වතුර කිව්වලි. වතුර හිඟයි. ගොයම් කපපු ගමන් ඇල පිහපුවාම ළිංවල අත්තිම බිංදුවට වතුර හිඳෙනවා... වතුර ප්‍රශ්නයේ විවිධ පැතිකඩ ගොඩයි.....

ටිලඟ මහාපා හිමිවී තිබුණේ ඒ ගොවිතැන හා බැඳපන ගොවි ගැටලු වලට. ඒ ප්‍රශ්න වඩාත් සංකීර්ණයි.වගා ණය, පොහොර සහනාධාර, අනවසර වගාකිරීම්, වල් අලි තර්පන වගේ තවත් ගැටලු රැසක් ඒ ප්‍රශ්නය හා බැඳී තිබුණා.

1 1/4 කණ්ඩායේ ගොවි මහත්වරු, ප්‍රංචි දරුවන් කරපින්නාමගෙන රැස්වීමට සහභාගිවූ මව්වරු, රජයේ සේවකයින්, ස්වෙච්ඡා සංවිධානවල ක්‍රියාකාරීන්, බාලා, මහලු, තරුණ ගම්මැසියන් ඉදිරිපත් කරපු විවිධ ප්‍රශ්න අතරේ අධ්‍යාපන ගැටලු, සෞඛ්‍ය ගැටලු, වාරිමාර්ග ගැටලු, මහාමාර්ග හා ප්‍රවාහන ගැටලු..... ඇදිලි තවත් පොදු ප්‍රශ්න රැසක් හියෝජනය වී තිබුණා.

පසුගිය ජූනි / ජූලි දෙමස ඇතුළත ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ EU ව්‍යාපෘතිය අනුවධපුරය, පොළොන්නරුවේ හා අම්පාර යන දිස්ත්‍රික්කවල හොරොව්පතාන, නැගෙනහිර ගුවරගම් පළාත, තමන්කඩුව, හිඟුරක්ගොඩ, අඩිඩාලව්වේන හා කල්පිඩණේ (දුවිඩ ජනතා වෙසෙන ප්‍රදේශ) ආවරණය වන පරිදි මෙවැනි ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 40 ක් පමණ පවත්වනු ලැබුවා. එම සාකච්ඡා සඳහා පොදු සේවා සපයයිමි හා සම්බන්ධ ප්‍රාදේශීය සභාවල ලොකු-කුඩා මට්ටමේ නිලධාරීන්, මහජන හියෝජනයින්, ප්‍රාදේශීය පහමධ්‍යස්থයින්, ප්‍රජාමූල සංවිධාන ක්‍රියාකාරීන් රැසක් සහභාගිවුණා.

ප්‍රාදේශීය පාලනය ආශ්‍රිතව ජනතාව මුහුණ දෙන ගැටලු හඳුනාගැනීම මෙම ව්‍යාපෘතියේ මූලික අදිසරයි.

අනතුරුව එහි දෙවන පියවර වශයෙන් සේවා ලාභීන්ගේ අත්දැකීම් ආශ්‍රය කරගනිමින් තෝරාගත් පොදු සේවා කිහිපයක ගුණාත්මක භාවයේ මට්ටම හා ඒවා වැඩිදියුණු කළයුතු ආකාරය පිළිබඳව පුරවැසි ප්‍රගති වාර්තාපත් ආශ්‍රයෙන් සම්කාරණයක් සිදුකෙරෙනවා. ඉන් අනතුරුව සම්කේෂණ ප්‍රතිඵල අනුව සේවා ලාභීන් හා සේවා දායකයින් සඳහා සුදුසු පුහුණුවා හාධාරිතාවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීමට EU ව්‍යාපෘතිය අදහස් කරනවා.

පුරවැසි ප්‍රගති වාර්තාපත් සම්කේෂණ ක්‍රමය ඉන්දියාවේ බැංගලෝරය වැනි නගරවල පොදු සේවා වල ගුණාත්මකභාවය මැනීම සඳහා ඉතා සාර්ථක අයුරින් යොදාගෙනය සම්කේෂණ ක්‍රමයක්. එමගින් කිසියම් පොදු සේවාවක් පවතින්නේ කවර මට්ටමකද යන්න එනම්, හොඳකම් කවර මට්ටමකින් හොඳද? දුර්වල නම් කවර මට්ටමකින් දුර්වලද ? යන්න සනාථ කර ගැනීමට අවස්ථාව සැලසෙනවා.

යුරෝපා සංගමයේ දායකත්වය යටතේ සිදුකෙරෙන මෙම ව්‍යාපෘතියේ අවසන් ඉලක්කය පරිපාලනය සඳහා මහජනතාවගේ සහභාගීත්වය සහ අවබෝධය වැඩිකිරීම තුළින් වඩාත් වගවීමක් සහිත ප්‍රාදේශීය පරිපාලනයක් ඇතිකිරීමයි.

''මේ ව්‍යාපෘතිය සඳහා තෝරාගත්තේ සිංහල, දුවිඩ හා මුස්ලිම් සම්මිශ්‍රණයක් සහිත විවිධ මට්ටම්වල සේවාලාභීන් වෙසෙන කලාප කිහිපයක්. ඒත් මුල් අදියරයේ දී ලැබූ අත්දැකීම් අනුව ඒ සියලු දෙනාගේ දැවෙන ප්‍රශ්නවල ස්වභාවයන් සමානයි. ව්‍යාපෘතිය ආරම්භයේදී පහළම මට්ටමේ ගැටළු සෙරෙහි වැඩි අවධානයක් යොමුකිරීමට සැලසුම්කර තිබුණත් මහජනතාවගෙන් ලැබුණ ප්‍රතිචාර අනුව ඊට වඩා ඉහළ මට්ටමේ සේවා හා බැඳී ඇති ගැටලු දක්වා මෙම ව්‍යාපෘතියේ පුළුල් කරන්න අප තීරණය කළා. ව්‍යාපෘතියේ මුල් අදියරේදී මහජන ඡන්දය අනුව හඳුනාගත් වඩාත්ම ප්‍රබල ගැටලුවලින් තතරක් තෝරාගනිමින් මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාවට නැංවීමට අප බලාපොරොත්තු වෙනවා'' ''

ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු පිළිබඳ අදහස් දක්වන ව්‍යාපෘති අධ්‍යක්ෂිකා සුලක්ෂණා ද මැල් පවසයි.

සමාජ විද්‍යා පර්යේෂකවරයෙකු වන ආචාර්ය ධනවර්ධන ගමගේ මහතා මෙම ව්‍යාපෘතියේ පර්යේෂණ කාර්යය භාරව කටයුතු කරන අතර වැඩසටහන් කළමණාකාරීනී නාදාසා පෙරේරා සමඟ ගයාත් ලියනගේ (අනුවාධපුර/ පොළොන්නරුව) හා කෙෂාන් සිරිලිංගම් (අම්පාර) ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කටයුතු භාරව ක්‍රියා කරති.

තොරතුරු දැනගැනීමේ අයිතිය ගැන මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක්

රටේ ආණ්ඩුකරන ක්‍රියාවලියට මහජනතාවට සහභාගිවීමට ඇති ඉඩ ප්‍රස්ථා වඩාත් වීවර කිරීම සඳහා ශ්‍රී ලංකාවට තොරතුරු දැනගැනීමේ අයිතිය දීලා ගැනීමේ වැදගත්කම පිළිබඳ විවිධ වෘත්තීකයින්, ජනමාධ්‍යවේදීන් හා සිවිල් සමාජය දැනුම්වත් කිරීමේ වැඩසටහන් මගින් ආරම්භ කර තිබේ.

මේ යටතේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ තොරතුරු වලට සම්මිශ්‍රිත සුවිශේෂී බලයක්, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා පුරවැසියන්ට තොරතුරු දැනගැනීමේ අයිතිය පාවිච්චි කළහැකි විදිය අස්ථා පිළිබඳවත් මහජනතාව දැනුම්වත් කරවන අතර වැඩමුළු, පුහුණු වැඩසටහන් හා සාකච්ඡා ඔස්සේ එම වැඩසටහන් මාලාව ක්‍රියාවට නංවනු ලැබේ.

මෙම වැඩසටහන් මාලාව යටතේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳව ග්‍රාමීය ප්‍රජාව දැනුම්වත් කිරීම හා නව මාධ්‍ය සඳහා එම දැනුම භාවිත කිරීම පිළිබඳ ප්‍රාථ ප්‍රජා ගුවන් විදුලියේ මාධ්‍යවේදීන් වෙනුවෙන් සැලසුම් කළ පුහුණු වැඩසටහන් පසුගිය යුනි 23 වැනිදින බණ්ඩාරවෙලදී පැවැත්වුණි.

එම වැඩසටහනේ සම්පත්දායකයින් ලෙස ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා හි හියෝජිත විධායක අධ්‍යක්ෂ රසික්ෂණ නානායක්කාර, අවබෝධාත්මක පෙළඹවීමේ අංශයේ වැ.බ අධ්‍යක්ෂිකා දිල්රංජනී හඳුන්නෙත්ති, සන්ඩිවේදන අධ්‍යක්ෂ ශාන් වීජේතුංග හා මාධ්‍ය හිලධාරී ආනන්දු ජයසේකර යන අය සහභාගි වූ අතර එහිදී ප්‍රාථ ප්‍රජා ගුවන් විදුලියේ මාධ්‍යවේදීන් එකිනේ තොරතුරු දැනගැනීමේ අයිතිය හා බැඳී ඇති ප්‍රශ්නේයේ ප්‍රශ්න හඳුනාගනිමින් ඒ පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය කරන ආකාරය පිළිබඳව සාකච්ඡාවක්ද පවත්වනු ලැබීය.

මෙම වැඩසටහන් මාලාව හරහා ශ්‍රී ලංකාවට තොරතුරු දැනගැනීමේ අයිතිය ස්ථාපිත කරගැනීම වෙනුවෙන් ක්‍රියාකාරීව මැදිහතිවන දැනුම්වත් පුරවැසි කණ්ඩායමක් ඇතිකරගැනීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය අපේක්ෂා කරයි.

දූෂණ මැඩලීම සඳහා ගවේෂණාත්මක ජනමාධ්‍යවේදීන් පුහුණු කිරීමට මොඩියුලයක් සැකසේ

දූෂණ මැඩලීම සඳහා ගවේෂණාත්මක ජනමාධ්‍යවේදය ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ගවේෂණාත්මක ජනමාධ්‍යවේදීන් පුහුණු කිරීම සඳහා සුසැලු මොඩියුලයක් සහ පුහුණු කිරීමේ අත්පොතක් සකසනීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය පියවර ගෙන තිබේ.

මෙම වැඩසටහනේ ප්‍රථම පියවර වශයෙන් එම වීෂය කෙෂ්ත්‍රය හා සම්බන්ධ සේවෂක ජනමාධ්‍යවේදීන් හා පුහුණුකරුවන් සමඟ මොඩියුලයට අදාලවන්විය යුතු කරුණු පිළිබඳව අදහස් ලබාගැනීමේ එක්දින සැසිවාරයක් පසුගිය ජූනි 9 දින කොළඹදී පැවැත්වූ අතර අනතුරුව ප්‍රේක්ෂක මාධ්‍යවේදීන් හා පුහුණුකරු-වන් සමග පුහුණුකිරීමේ මොඩියුලය අත්හදා බැලීමේ සිදිදිග වැඩමුළුවක් ජූනි 11-14 දිනවලදී කළුතරදී පැවැත්වීණි.

එම මොඩියුලය සහ පුහුණු අත්පොත සකස් කරනු ලබන්නේ ඉන්දියාවේ ගවේෂණාත්මක මාධ්‍යවේදී මෙන්ම සුප්‍රකට කෝබ්‍රා පොස්ට් ගවේෂණාත්මක වෙබ් අඩවියේ කර්තෘ අභිරාදද්ධ බෙහෙල් සහ ඩෙන්මාර්ක් ජාතික ඇසඩම්මේ පුහුණුකරු රංග තලපුරිය යන මහත්වරුන්ගේ මූලිකත්වයෙනි.

ගොඩ්වරක් ඊබට් පදනමේ මූල්‍ය අනුග්‍රහය ඇතිව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ශක්‍යතා ප්‍රවර්ධන අංශය සහ සන්හිඳේදන අංශය එකාබද්ධව මෙම වැඩසටහන මෙහෙයවයි.

වාර්ෂික මහා සභා රැස්වීම 2010

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ නෝවෙම්බර් මාර්ගික මහසභා රැස්වීම පසුගිය ජූනි 30 වැනි දින කොළඹ "ගේලෝබල් ටවර්" හෝටලයේදී පැවැත්වෙනිණි. එහිදී TISL සභාපති. හිටපු හියෝජ්‍ය පීඨාධිපතිතිති එම්. ඩී. ඒ හැරලිඩ් මහතා ඉදිරි වර්ෂය සඳහාද අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ධුරයට පත්වූ අතර අනුෂා කුමාරස්වාමි, එස්. කේ. ලියනගේ, ඒ.කේ නානායක්කාර, හෙළුම් ගමගේ හා චන්ද්‍රා ජයරත්න යන මහත්ම මහත්මිනු අධ්‍යක්ෂවරු වශයෙන් තෝරා පත්කරගනු ලැබීය.

TISL හි විශාණකවරු වශයෙන් අර්තසර්ටි ඇන්ත් යංග් සමාගම තෝරාපත්කරගන්නා ලදි.

පුරවැසියන්ට අත්වැලක්

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉටුකරන සේවාවන් පිළිබඳ තොරතුරු ඇතැළුත් අත්පොතක් වළිදැක්වීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය පියවර ගෙන තිබේ.

මහජනතාවට තම සේවා අවශ්‍යතාවයන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පහසුවෙන් ඉටුකරවා ගැනීමට අවශ්‍ය උපදෙස් සැපයෙන මෙම අත්පොත හඳුන්වා දී ඇත්තේ "පුරවැසි අත්වැල" නමිනි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉටුකරන සේවාවන් සහ එම සේවාවන් ලබාගත හැකි ආකාරයන් ඊට අදාල වන ලියකියවිලි පිළිබඳවත් තොරතුරු ඉතා සරලව එහි ඇතැළත්ව තිබේ.

සේවාලාභීන් තමන්ගේ නොදැනුවත්කම නිසා දුෂණයේ ගොදුරක් වන බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉලක්ක කරගනිමින් සංවිධානය කරනු ලැබූ වැඩසටහන්වලදී තහවුරු විය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් සපයනෙන සේවාවන් හමුවීය යුතු හිඟවාරීන් , තමන් රැකෙන යා යුතු ලියවිලි පිළිබඳවා මහජනතාව තුළ දැනුමක් පවතින්නේ නම් ඔවුන්ට අතරමැදියන්ගේ සහාය පැතීමට හෝ අල්ලස් ලබාදීමට අවශ්‍ය නොවන බව එම වැඩසටහන්වලට සහභාගිවූවන් ප්‍රකාශ කර සිටියහ.

එම ඉල්ලීම සැළකිල්ලට ගනිමින් නිර්මාණය කෙරෙන 'පුරවැසි අත්වැල' අත්පොත මහජනතාව වෙත නොමිලයේ ලබාදීම කැරගෙන පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ඇරඹීමට නියමිතය.

සුපිළිපන්

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා - පුවත් හසුන

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
සුපිළිපන් දේශයක් උදෙසා

28/1, බුදුරස් පුදමිණ, කොළඹ 07
දුරකථනය - 011 2501474 ෆැක්ස් - 011 2592287
විද්‍යුත් තැපෙල - tisl@tisrilanka.org වෙබ් අඩවිය - www.tisrilanka.org

ජූලි 2010

වාර්ෂිකව ඩොලර් බිලියන 3000 ක් මකර කටේ

ලෝකය පුරා වාර්ෂිකව සිදුවන සුළු පරිමාණ දූෂණවල ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 3000කට (රුපියල් බිලියන තුන් ලක්ෂයක්) ආසන්න බව ජාතික්කන්ද සංවිධානය මඟින් සිදුකළ සමීක්ෂණවලදී හෙළිදරව් වී ඇතැයි 'සමාජ වගවීම පිළිබඳ අනුබද්ධ ජාලයේ' (ANSA) ප්‍රධාන විධායක නිලධාරි ආචාර්ය ගෝතමුමාරි ක්‍රිෂ්ණ තමිපි පවසයි.

කෙසේ නමුත් ලෝකයෙන් දිළිඳු බව තුරන් කිරීමට අවශ්‍ය වන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 690 ක් පමණක් බවද ආචාර්ය ගෝතමුමාරි මහතා පෙන්වා දෙයි.

පනතාවගේ නොදැනුවත්කම සහ සමාජ වගවීමක් නොමැතිවීම ලොව පුරා දූෂණ වංචා ඉහළ ගාමට හේතු වී ඇතැයි පෙන්වාදෙන ඒ මහතා, ඊට එරෙහිව ක්‍රියාකිරීමටත් රටක සමාජ වගවීම ඉහළ නැංවීමටත් අරගය තරම් මෙවලම් හා සම්පත් පවතිනුයේ ඒ සම්බන්ධව මහජනතාවගේ පෙළඹීමක් නොමැති බව සඳහන් කළේය.

ඔහු මෙම අදහස් පළකළේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය සහ ආසියානු පදනමේ ආරාධනයෙන් මෙරටට පැමිණ සමාජ වගවීම හා තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වැඩමුළු කිහිපයකට සහභාගි වෙමිනි. ඇතැම්තනයව සිටින පනතාව වඩාත් ක්‍රියාශීලී පුරවැසියන් බවට පත් කිරීම හරහා සමාජ වගවීමට ඔවුන්ගේ දායකත්වය ලබාගත හැකි බවද ඔහු එහිදී පෙන්වා දුන්නේය.

"ප්‍රජාවගේ අපේක්ෂා පවතින්නේ පහළ මට්ටමක. ඒ නිසා සමාජය අවට සිදුවන ක්‍රියාකාරකම් ගැන ඔවුන් තුළ පවතින්නේ අඩු උනන්දුවක්. එබැවින් සිවිල් සංවිධාන එක්වී ඔවුන්ව දිරිමත් කළ යුතුයි. ඒ වගේම සමාජ වගවීම පිළිබඳ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීමට ඔවුන්ව පුහුණු කරවිය යුතුයි" ගෝතමුමාරි මහතා පැවසීය.

ගෝතමුමාරි ක්‍රිෂ්ණ තමිපි

බංගලිදේශය තුළ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ක්‍රියාත්මක කර වසර කිහිපයක් ගතවී ඇතත් ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් වන්නේ අතලොස්සක් පමණක් බව පැවසූ ඔහු එයට හේතුව මහජනතාව ඒ පිළිබඳව තොරතුරු නොදන්නාකම යැයි පෙන්වාදුන්නේය.

"දුප්පත් පනතාවට අවශ්‍ය පහසුකම් ලැබෙන්නේ නැහැ. හිඟි සේවාවන් ඉටුවන්නේ නැහැ. ඉන්ජියාවේ හිටපු ආමඳැති රජවරු ගාන්ධි මහතා වරක් ප්‍රකාශ කළා, වරෙට සාමාන්‍ය පනතාව වෙනුවෙන් වසරක් පාසා වෙන් කරන මුදලින් ඔවුන්ට හිමිවන්නේ 15% කටත් වඩා අඩු මුදලක් බව. ඊට වසර කිහිපයකට පසු ඔහුගේම පුත් රාහුල් ගාන්ධි ප්‍රකාශ කළා. දුප්පත් පනතාවට හිමිවන්නේ වෙන්කරන මුදලින් 5% කටත් වඩා අඩු ප්‍රමාණයක් බව. ඒකයි යථාර්ථය. ඒ නිසා තමන්ගේ අයිතීන් දිනාගන්න පනතාව පෙළගැස්විය යුතුයි. එවැනි පෙළගැස්මක හරහා, ඉන්ජියාවේ පනතාව තොරතුරු දැනගැනීමේ පනත වගේ මූලික අයිතීන් ගණනාවක් දිනාගෙන තිබෙනවා" ගෝතමුමාරි මහතා කීවේය.

ඊකල්පයන්ගේ අඩුවත්, වගවීමේ හා සහභාගීත්වයේ අඩුවත් මහජනතාවට තම අයිතීන් හා සේවාවන් ලබාගැනීමට බාධාවක් වී ඇතැයැයි පවසන ඔහු ඒ සඳහා ගැටලු කිහිපයකට විවරණ කරමින් සිවිල් සංවිධාන එක්වී ඔවුන්ට දිරිමත් කළ යුතු ක්ෂේත්‍රයන්ට මුදල් ලබා නොදීම සැකසීමේදී මුදල් වඩාත් වෙන් කළ යුතු ක්ෂේත්‍රයන්ට මුදල් ලබා නොදීම ඇතැයැයි සැකසීමේදී ජනතා සහභාගීත්වය ලබා ගොනැගීම, හිරිඳ්ෂණයේ දුර්වලතා එම තත්ත්වය වඩාත් තියුණු කිරීමට හේතුවී ඇතැයිද සෙනෙහි පවසුණේය.

"මේ සඳහා ජනතාවගේ හඬ අවදි කළ යුතුයි. ඒ වගේම ජනතාව පෙළගැස්විය යුතුයි එකට එක උදාහරණයක් තමයි 'Nine is Mine' යනුවෙන් ඉන්ජියාවේ ක්‍රියාත්මක වූ මහජන හඬ. මේ හඬ ඇරගුණේ අයවැය මගින් සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රයට 9% ක ප්‍රතිශතයක් ලබාගන්න. එය සාර්ථක වුනේ නැතත් මේ සටන ඉතා ප්‍රබල අවධානයක් දිනාගත්තා".

මහජන දායකත්වය අහිමි පළාත් පරිපාලනය

පළාත් පාලන ආයතන පිළිබඳ අණ පනත් අනුව මහජනතාවට පළාත් පාලන ආයතනවල රැස්වීම් හා කාරක සභා රැස්වීම්වලට සහභාගිවීමට පමණක් නොව එම රැස්වීම්වල වාර්තා පිටපත් පවා ලබා ගැනීමේ අවසරය හිමි වී ඇතත් ඒ සඳහා ඉදිරිපත්වන්නේ අතලොස්සක් පමණක් යැයි පළාත්පාලන ආයතන බලධාරීහු පෙන්වා දෙති.

මෙම තත්ත්වයට ප්‍රධානතම හේතුව අදාල ප්‍රණාම කෙටුම්පත්වේ මෙන්ම සමාජ වගවීම පිළිබඳව මහජනතාවට දැනුම්වත් කිරීමේ අවශ්‍යතාවය ඇතුළු කියලමු පනතේ වගන්ති ගණනාවක් පිළිබඳව මහජනතාවට දැනුම්වත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ අදාල ආණ්ඩුවේ නිලධාරීන්ට ලැබී තිබුණේ ඉතාමත් අල්ප වශයෙනි. ඒ නිසා සමාජ වගවීම පිළිබඳ ක්‍රියාකාරකම් සිදුකිරීමේ දී ඇතැයි සමාජ වගවීම පිළිබඳ අනුබද්ධ ජාලයේ (ANSA) ප්‍රධාන විධායක නිලධාරි ආචාර්ය ගෝතමුමාරි ක්‍රිෂ්ණ තමිපි පවසයි.

මහජනතාව තුළ පවතින මෙම අඩු දැනුම නිසා මහ නගර සභා, නගර සභා මෙන්ම ප්‍රාදේශීය සභාවලින් තමන්ට ඉටුකර ගත හැකි සේවාවන් හිඟි පරිදි ලබාගැනීමට ජනතාව බිහුනාවක් අපොහොසත් වී ඇතැයිද ඒ හේතුවෙන් ඇතැම් පළාත්පාලන ආයතනවල දුෂණය හා වංචාව රජයක බවද සමාජ ක්‍රියාකාරීහු හා විද්වත්හු පෙන්වා දෙති.

මේ පිළිබඳව අදහස් දැක්වූ හපුතලේ නගර සභාවේ ලේකම් අමරදාස මහතාගේ මහතා ප්‍රකාශ කළේ නීතියට අනුව මහජනතාවට ලබාදිය යුතු තොරතුරු ඉදිරිපත් කිරීමට තම නගර සභාව සූදානම්වී සිටියද එම තොරතුරු ලබාගැනීමට කිසිවෙකු මේ දක්වා ඉදිරිපත් නොවූ බවය.

මහජනතාව තුළ පවතින මෙම අඩු දැනුම නිසා මහ නගර සභා, නගර සභා මෙන්ම ප්‍රාදේශීය සභාවලින් තමන්ට ඉටුකර ගත හැකි සේවාවන් හිඟි පරිදි ලබාගැනීමේ ජනතාව බිහුනාවක් අපොහොසත් වී ඇතැයිද ඒ හේතුවෙන් ඇතැම් පළාත්පාලන ආයතනවල දුෂණය හා වංචාව රජයක බවද සමාජ ක්‍රියාකාරීහු හා විද්වත්හු පෙන්වා දෙති.

ඒ අනුව නගර සභාවේ අයවැය වාර්තා, සභා වාර්තා මෙන්ම විවිධ මූල්‍ය වාර්තා නගර සභාවේ පිළිගැනීමේ හිලධාරි කවුන්ටරය අසල මහජන ප්‍රදර්ශනයට තබා ඇත.නගරවාසියන්ට එම වාර්තා පරීක්ෂා කිරීමට අමතරව ඒවායේ පිටපත් ලබාගැනීමේ පහසුකමද සලසා දී තිබේ.

ශ්‍රී ලංකාවේ හොඳම නගරසභාව ලෙස පුරා වසර කිහිපයක් සම්මානයට පාත්‍ර වූ බණ්ඩාරවෙල නගර සභාව සමාජ වගවීම පිළිබඳව තවත් පියවරක් ඉදිරියට ගබඩිත් ඉදිරි අයවැය සකස් කිරීම සඳහා මහජනතාවගේ යෝජනා සහ අදහස් ලබා ගැනීමට කටයුතු යොදා තිබේ.

ඒ සඳහා මේ වන විට පුරවැසි කමිටු 20 ක් නගර සභා බල ප්‍රදේශය පුරා පිහිටුවා ඇති අතර නගරාධිපතිවරයා ඇතැළු නිලධාරීන් මෙම කමිටු හමුවීමට ගොස් ඉදිරියේදී ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති පිළිබඳව මහජනතාවගේ යෝජනා සහ උපදෙස් ලබාගැනීමට නියමිත බව නගර සභාවේ ලේකම් ගුණදාස තම්බිරාජ මහතා ප්‍රකාශ කළේය.

එසේ ලබාගන්නා තොරතුරු අනුව ප්‍රමුඛතාවය ලබාදිය යුතු ව්‍යාපෘති හඳුනාගෙන එම ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කරන බවත් අදාල මුදල් ගණුදෙනු සියල්ලම ජනතාවගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන බවත් ලේකම්වරයා පැවසීය.

"අප සියළු ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කර ඒවා ජනතාවට ප්‍රදර්ශනය කරනවා. ඔවුන්ට අවශ්‍ය පිටපත් ලබා දෙනවා. උදාහරණයක් ලෙස මාර්ග ඉදිකිරීමක් නතලොත් ඒවාට යොදන තාර වර්ග, ගල් කියුබ් සංඛ්‍යාව, ආයෝජනය කරන මුදල ආදී සියළු තොරතුරු ජනතාවට දැනගත හැකියි" ගුණදාස මහතා කීවේය.

මේ වන විට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් ලක්ෂ 200 ක මුදලක් වෙන්කර ඇති බවත් නගරසභාවේ කිසිදු මන්ත්‍රීවරයෙකුට ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් බාරගත නොහැකි බවත් නගරාධිපති හඳිත් ප්‍රියංකර සූරියගේ මහතා පැවසීය.

තම සභාවේ ටෙන්ඩර් පරිපාටීන්දු ඉතා විනිවිදභාවයකින් ක්‍රියාත්මක කරන බවත් ටෙන්ඩර් විවෘත කිරීම සඳහා ඔබන්නේ සභාවේ හිලධාරීන් මෙන්ම ටෙන්ඩර්කරුවන් ඉදිරියේ බවත් පැවසූ සූරියගේ මහතා කිසිදු ටෙන්ඩර් පිරිහැමීමක් මන්ත්‍රී කණ්ඩායම විසින් හෝ සිදු නොකරන බව පැවසීය.

එමෙන්ම සෑම ව්‍යාපෘතියක්ම අවසානයේ එහි ගෙවීම් සිදුකිරීම අදාල ප්‍රදේශයේ මහජන කමිටුව විසින් අනුමත කළ යුතු බවද ඔහු සඳහන් කළේය.

නගරසභා රැස්වීම නැරඹීමට ජනතාවට පැමිණිය හැකි බවත් රැස්වීම්වලින් පසුව මන්ත්‍රීවරයන් හමුවී ප්‍රශ්න ඉදිරිපත් කිරීමට ඔවුන්ට අවස්ථාව ඇති බවත් කී නගරාධිපතිවරයා පැමිණිලි හා යෝජනා ඉදිරිපත් කිරීමට විශේෂ පෙට්ටියක් නගරසභාවේ තබා ඇති බවද පැවසීය.

නගරසභාව මඟින් ආදායනාගාරයේ සේවාවන් නොමිලයේ ලබාගැනීමට ඉඩකඩ සලස්වා ඇති අතර මරණයකදී ජලය, වෙන්ටි, පුටු හා අනෙකුත් අවශ්‍යතාවයන් නොමිලයේ සැපයේ.

බණ්ඩාරවෙල නගර සභාව

පොදු පන චක්සත් පෙරමුණ විසින් පාලනය කරනු ලබන බණ්ඩාරවෙල නගර සභාව අනෙකුත් පළාත් පාලන ආයතනවලට ආදර්ශයක් ලබාදෙමින් තම ක්‍රියාකාරකම් හා මූල්‍ය කටයුතු පිළිබඳ මීනෑම තොරතුරක් විමසා බැලීමේ පහසුකම මහජනතාව වෙත ලබාදෙමින් සමාජ වගවීම තහවුරු කිරීමට පියවර ගෙන ඇත.

ඒ අනුව නගර සභාවේ අයවැය වාර්තා, සභා වාර්තා මෙන්ම විවිධ මූල්‍ය වාර්තා නගර සභාවේ පිළිගැනීමේ හිලධාරි කවුන්ටරය අසල මහජන ප්‍රදර්ශනයට තබා ඇත.නගරවැසියන්ට එම වාර්තා පරීක්ෂා කිරීමට අමතරව ඒවායේ පිටපත් ලබාගැනීමේ පහසුකමද සලසා දී තිබේ.

ශ්‍රී ලංකාවේ හොඳම නගරසභාව ලෙස පුරා වසර කිහිපයක් සම්මානයට පාත්‍ර වූ බණ්ඩාරවෙල නගර සභාව සමාජ වගවීම පිළිබඳව තවත් පියවරක් ඉදිරියට ගබඩිත් ඉදිරි අයවැය සකස් කිරීම සඳහා මහජනතාවගේ යෝජනා සහ අදහස් ලබා ගැනීමට කටයුතු යොදා තිබේ.

ඒ සඳහා මේ වන විට පුරවැසි කමිටු